# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය
த. பெ.இ 2171635
Po.Box No
10120

ෆැක්ස්
தொலைநகல
Fax
011-

දුරකථන
தொலைபேசி
Telephone
011-2887973
(HUNTING)

වෙබ්.ලිපිනය
இணையதளம்
Web Site
www.Police.lk

ඊ මේල්
மின்னஞ்சல்
E-mail
dirmedia@police.gov.lk


මගේ අංකය
எனது இலக்கம்
My NO
1185 / 2024

ඔබේ අංකය
உமது இலக்கம்
Your No
/ 2024

දිනය
திக
Date
18/07/2024
පැය 1850

**මාධ්‍ය නිවේදනය**

**විදෙස්ගතව සිට මෙරටට පැමිණි පුද්ගලයෙකු පැහැර ගැනීමක් - මාවතගම පොලිස් ස්ථානය.**

කුවේට් රාජ්‍යයේ සිට මෙරටට පැමිණි ශ්‍රී ලාංකික පුද්ගලයෙකු 2024.07.17 වන දින රාත්‍රී කාලයේ කටුනායක ගුවන් තොටුපලේ සිට ඔහු පදිංචි මාතලේ ප්‍රදේශයට කුලී රථයකින් ගමන් කරමින් සිටියදී කුරුණෑගල කැප්පටිගල මාර්ගයේ බරන්දන ප්‍රදේශයේදී පිරිසක් කැබ් රථයකින් පැමිණ ඔවුන් ගමන් කළ කුලී රථය හරස් කර නවතා විදෙස් ගතව සිට මෙරටට පැමිණි පුද්ගලයා පැහැරගෙන ගිය බවට කුලී රථ රියදුරු විසින් මාවතගම පොලිස් ස්ථානයට කරන ලද පැමිණිල්ලක් මත විමර්ශනයක් ආරම්භ කර ඇත.

පැහැරගත් පුද්ගලයා සම්බන්ධයෙන් කුරුණෑගල රත්ගල්ල පොලිස් විශේෂ කාර්ය බලකා කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත එදින සවස් කාලයේ නාරම්මල පොලිස් වසමේදී පැහැරගත් පුද්ගලයා හා සිද්ධියට අදාල සැකරුවන් 04 දෙනෙකුද එම පැහැර ගැනීමට භාවිතා කළ කැබ් රථය සමඟ අත්අඩංගුවට ගෙන මාවතගම පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 30, 32, 37 හා 39 වයස් වල පසුවන නාරම්මල ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

පැහැරගැනීමට හේතුව මෙතෙක් අනාවරණය වී නොමැති අතර මෙම අපරාධය සම්බන්ධයෙන් වැඩිදුර විමර්ශනයේදී අපරාධය සිදුව ඇත්තේ රිදීගම පොලිස් වසමේ කච්සිගමුව ප්‍රදේශයේ බැවින් ඉදිරි විමර්ශන කටයුතු සිදු කරගෙන යාමට සැකකරුවන් හා අනෙකුත් දේපල රිදීගම පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

වැඩිදුර විමර්ශන රිදීගම පොලිසිය මඟින් සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**